# සමාජයේ වෙනසට
## හසුවන
# ගොඩ ගොවිතැන

හේන් වගාව යන වචනය ඇසෙන විට එය ගතානුගතික ක්‍රම ශිල්ප මත පදනම් වූ සම්ප්‍රදායික කෘෂි රටාවක් යන අදහස නිතැතින්ම දනේ. ඇත්ත වශයෙන්ම නොදියුණු කෘෂි වගා ක්‍රමයක් වශයෙන් ලොව පුරා පැතිර පවත්නා හේන් වගාව යටතේ ඉඩමකින් ප්‍රශස්ත ප්‍රයෝජන ලබා ගැනීමක් නොකෙරෙන අතර සම්ප්‍රදායික කෘෂිඅංශයේ නියැලී සිටින ගොවීන්ගේ අවශ්‍යතාවන් පිරිමසා ගැනීමත් පමණක් සිදු කෙරේ. ස්වභාවික කැලෑ විනාශ කිරීම වන සම්පත් විනාශ කිරීම හා ඉඩම් සෝදා පාලුව අනිවාර්යයෙන්ම හේන් වගාවකින් සිදුවන නිසා හේන් වගාව රටට අහිතකර වගා ක්‍රමයක් වශයෙන් ක්‍රියාත්මක කිරීම නතර කිරීමට පවා බොහෝ රටවල ආර්ථික ප්‍රතිපත්ති සකස් කර ඇත. ශ්‍රී ලංකාවේද හේන් වගාව සීමා කිරීම සඳහා කෘෂි ආර්ථික සැලසුම් සකස් කොට ඇත.

එහෙත් ලෝක ආර්ථික ගැටළු හා නව ශිල්ප ක්‍රම යටතේ නවීකරණයට ගොදුරුවෙමින් පවත්නා හේන් වගාව සම්ප්‍රදායික ගතානුගතික ස්වරූපයෙන් මිදී ආර්ථික වශයෙන් එලදායී කෘෂි රටාවක් බවට පරිවර්තනය වෙමින් පවත්නා ලක්ෂණ වර්තමානයේ දැකිය හැක. මේ නිසා දැනට දිවයිනේ හේන් වගාව කරනු ලබන බොහෝ ප්‍රදේශවල සම්ප්‍රදායික හේන් වගා ක්‍රමය වෙනුවට හරිත විප්ලවයේ බලපෑමට හසු වූ නව හේන් වගා ක්‍රමයක් දැකිය හැක. මේ අනුව වගා කන්නයෙන් කන්නයට හෝ වසරෙන් වසරට වගා කරනු ලබන වන සතුන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා වන සම්පත විනාශ කොට සකස් කරනු ලබන දඬු වැටකින් වට කරන ලද වර්ෂා ජලය මත පදනම් වූ වියලි කෘෂි භෝග කිහිපයක් පමණක් වගා කරනු ලබන පැරණි හේන් වගා ක්‍රමය ක්‍රම කිහිපයක් යටතේ ම සීඝ්‍ර ලෙස වෙනස් වෙමින් පවතී.

1. වෙනස් කරනු ලබන භූමි පරිභෝග රටාවක් වෙනුවට මඩ ගොවිතැන් ක්‍රමයේ මෙන් ස්ථාවර භූමි පරිභෝග රටාවකට ගොවියා යොමු වීම මේ යටතේ ඉඩම් වෙනස් කරමින් එලදාව වැඩිකර

පර්යේෂණ හා
පුහුණු කිරීමේ නිලධාරි
ජී. මහින්ද
හේනේගෙදර විසිනි.

ගැනීම සඳහා පියවර ගැනීම වෙනුවට පවත්නා ඉඩමෙන් ප්‍රශස්ත ප්‍රතිඵල ලබාගැනීමට ගොවියා පෙළඹී ඇත. මෙම තත්වය ඇති වී තිබෙන්නේ රටේ ජනගහනය වැඩිවීම හා ආර්ථික සංවර්ධන යෝජනා ක්‍රම ග්‍රාමීය ප්‍රදේශ දක්වා ව්‍යාප්ත වීමත් සමඟම හේන් වගාව සඳහා ඉඩම් සොයා ගැනීමට ගොවීන් අතර තරඟකාරී ස්වරූපයක් ඇතිවීම හේතුවකි.

2. නව යෙදවුම් වර්ග ආදිය භාවිතා කිරීම:— එකම ඉඩමෙන් වැඩි එලදාවක් ලබා ගැනීමට හා ඉඩමේ සශ්‍රීක භාවය ආරක්ෂා කර ගැනීම සඳහා ගොවීන් පොහොර භාවිතයට පෙළඹීම. මුල් කාලයේදී ගොවීන් හේන් වගාව සඳහා කිසිදු පොහොර වර්ගයක් භාවිතා කළේ නැත. එහෙත් වර්තමානයේ බොහෝ විට ගොවියෝ ස්වභාවික පොහොර භාවිතය මෙන්ම රසායනික පොහොර භාවිතය කෙරෙහි විශ්වාසයක් තබා ඇති බව පෙනේ.

3. වාරිමාර්ග ක්‍රම භාවිතයට හුරුවීම මුල් කාලයේ හේන් වගාව බහුල වශයෙන් අහස් වැස්ස මත පදනම් වුවත් වර්තමානයේ වතුර පොම්ප කිරීම, නළ ළිං සෑදීම ආදිය මගින් අවශ්‍ය ජලය ලබා ගැනීමට ගොවියා පෙළඹී ඇත.

4. නව යන්ත්‍ර සූත්‍ර භාවිතය, ඉඩම් හෙලි කිරීම හා සුද්දකිරීම වැනි කටයුතු ගතානුගතික ක්‍රම යටතේ ගිනි තැබීම මගින් කරනු ලැබුවත් වර්තමානයේ බොහෝ විට ට්‍රැක්ටර් හා වෙනත් යන්ත්‍ර සූත්‍ර උපයෝගී කර ගනිමින් එම කාර්යය කරනු ලැබේ.

5. පැරණි හේනක දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයක් වන දඬු වැට වෙනුවට බොහෝ විට වර්තමානයේ දක්නට ඇත්තේ කටු කම්බිවලින් සකස් කරන ලද කොන්ක්‍රීට් කනු සහිත වැටවල්ය. බොහෝ විට වැටට දැව දඬු වර්තමානයේද යොදා



ගොවිතැන මෙන් මේ ගැමි ජීවිතය: සමාජ වෙනසට හසුවී ඇත.

ගනු ලැබුවත් කටුකම්බි භාවිතයට ගොවියා හුරුවී ඇති බව පෙනේ.

6. ආර්ථිකමය වශයෙන් එලදායී භෝග රටාවනට හුරුවීම, පැරණි හේන් වගාව මූලික වශයෙන් සංකේන්ද්‍රනය වූයේ පාරිභෝගික භෝග වර්ග කිහිපයක් මත වුවත් නවී හේන් වගාව වාණිජ භෝග මත පදනම් වී ඇත. මේ නිසා වර්තමානයේ බොහෝ විට හේන් ගොවියා උත්සාහ කරන ලබන්නේ ආර්ථිකමය වශයෙන් එලදායී මිරිස් හා වෙනත් භෝග වගී වගා කිරීමට පමණි. පාරිභෝජනය සඳහා ගනු ලබන එළවළු හා කරක්කන් ආදිය වගා කිරීමට දක්වන්නේ සුළු සැලකිල්ලකි.

7. පැරණි හේනක ගසක් මත තනා තිබූ පැළ වෙනුවට වරිච්චියෙන් හෝ සාදන ලද සාමාන්‍ය ස්ථාවර ගෙයක් හේන තුළම සාදා තිබීමත් වර්තමානයේ දැකිය හැකි තවත් ලක්ෂණයකි.

8. හේන් ගොවියාගේ ආකල්පමය වශයෙන් වෙනස් වීම පැරණි හේන් ගොවියා බොහෝ විට ගතානුගතික අදහස්වල බැඳී සිටී අතර හේන් වගාව හේන් ගොවියාගේ ජීවිතය හා උඩී ලෙස බැඳී තිබිනි. මේ අනුව නිසි ලෙස තරුණ වියට පත් අයෙක් තනියෙන් හේනක් වගා කොට අස්වනු ලබන්නේ නම් ඔහුට තම ජීවිතය ස්වාධීනව ඉදිරියට ගෙන යා හැකි අයෙක් බවට වැඩිහිටියන් විසින් පිළිගනු ලබයි. මේ හේතුව නිසා තරුණයාගේ ආවාහ විවාහ කටයුතුද හේනක් තනියෙන් වගා කිරීමත් සමගම තීරණය වී සමාජයට වගකීම් සහිත පුද්ගලයෙකු වශයෙන් එකතු වෙන් පසු විවාහකයෙකු වශයෙන් වගකීම් භාරගන්නා තරුණයා ජීවත්වීම සඳහා තන්යෙන් වෙහෙස දැරීමට හුරුවේ. එහෙත් වර්තමානයේ යම් අයෙක් තනියෙන් හේනක් වගා කළ පමණින් ඔහු විවාහවීමට සුදුනම් නොවේ. බොහෝ විට ව්‍යාපාරික අදහස් මත ආදායම් උපයන ආකාරයට හේන් වගාව කිරීමට උත්සාහ කිරීමකි වර්තමානයේ දැකිය හැක්කේ.

අවට පුරාණ ගම්වලින් සංක්‍රමණය වී වනාන්තර ප්‍රදේශ හෙළි කරමින් ව්‍යාපාරික වගා කටයුතුවල නියැලී සිටින ව්‍යාපාරික ගොවීයන්ගේ ආභාෂය තුළින් හේන් වගා කරන අනෙක් ගොවීන්ද නවී කරණයේ බලපෑමට හසුවී සිටින අතර මේ නිසා දිවයිනේ බොහෝ ප්‍රදේශවල හේන් වගාවට ඉහත කී ලක්ෂණ එකතුවී තිබේ. මේ නිසා සිදුවී ඇති අතුරු ප්‍රතිඵලය වන්නේ ගොවියා හේන් ගොවිතැන කෙරෙහිද සම්ප්‍රදායික මඩ ගොවිතැන කෙරෙහි දක්වන සැලකිල්ල දක්වීම හා හේන් වගාවට යොදනු ලබන භූමියෙන් උපරිම ආයෝජන ලබා ගැනීමට උත්සාහ කිරීමයි. මේ නිසා සෝද පාලුව වැනි පැරණි හේන් වගාවේ දැකිය හැකි අවාසිදායක තත්වය නැති වී ඇති අතර බොහෝ විට එකම භූමිය තුළින් අස්වැන්න ලබා ගැනීමට පියවර ගන්නා නිසා ඉඩම් සංරක්ෂණයක්ද සිදු වේ. මේ හේතුවෙන් ගොවිතැන යන්නෙහි දිවයිනේ අනෙකුත් බොහෝ ප්‍රදේශවල පවත්නා ආකාරයට නොව ගොවිතැනක ලක්ෂණ දැකිය හැක. ඒ අනුව ගොඩ ගොවිතැන් ක්‍රමයේ පවත්නා ලක්ෂණ නූතන හේන් වගාව තුළින්ද හඳුනා ගැනීමට හැකිවී ඇත.